# 1. මෛත්‍රිය පහළ විය

ඈත අතීතයේ දී රුසියාවේ එක්තරා රජතුමෙක් විසීය. ඔහු දසරාජ ධර්මයෙන් රට පාලනය කෙළේය. නමුත් රට ඉතා විශාල බැවින් ඔහුට රට මුළුල්ලේම ඇවිදින්නටවත් සියලුම පුරවැසියන් දැනහැඳින ගැනීමටවත් නොහැකි විය. මේ හේතුව නිසා රටවැසියන් සිතුවේ රජු ඔවුන්ට ආදරයක් සැලකිල්ලක් නැති දරුණු තැනැත්තෙකු කියාය.

පිය රජතුමා ජනප්‍රිය නැති බව පුත් කුමරා දැන සිටියේය. ඔහු තම රටවැසියන් දැන ගැනීමටත් ඔවුන්ට ආදරය බව දැක්වීමටත් ඔවුන්ගේ ගම්වල සංචාරය කිරීමට තීගමනය කෙළේය. දිනක් ඔහුගේ ඇමතිවරු පිරිවරාගෙන රජ ඇඳුමින් සැරසී ඉතාම දුප්පත් ගමකට සංචාරය පිණිස ගියේය.

ඒ පිටිසර ගමට ඇතුළු වී කුමරු ගමන් ගෙන කුඹුරක වැඩ කරන ගොවියකු දැක ඔහු හා කථා කිරීමට ඔහුට ළඟා විය. මෙය දුටු ගොවියා තම උදැල්ලත් කර තබා පැන දිව්වේය. කුමරු මදක් දුර යන කල ස්ත්‍රියක් දර කඩනවා දැක ඇය සමඟ කථා කිරීමට ළං විය. ඇයද දර මිටිය තබා පැන දිව්වාය. මෙසේ ඉදිරියට යන කල ගෙදරක් අසල මවක් දරුවෙකු සෝදමින් සිටිනු දැක්කේය. එතැනට ළංවෙත්ම, ඒ මව දරුවාත් රැගෙන ගෙට පැන ගත්තාය. මෙසේ ගම හරහාම කුමාරයාට කිසිවෙකු සමඟ කථා කිරීමටවත් නොහැකි විය. අවසානයේ දී බොහෝ දුකට පත්වී ඔහු වෙතින් මිනිසුන් පළායන්නේ මන්දැයි කුමරු ඇමැතිවරුන්ගෙන් විමසුවේය. ඔවුන්ගෙන් තැනැත්තෙකු හේතුව වටහාගෙන කුමරුට එය පහද දුන්නේය. එනම්, රජතුමාගේ රජ ඇඳුමින් මිනිසුන් ඔහු හඳුනාගෙන ඔහුට බයෙන් පළා ගිය බවයි. එබැවින් කුමාරයා කණගාටුවෙන් රජ මාළිගාවට ආපසු ගියේය.

අවුරුදු හතකට පසු මේ ගමට දොස්තර මහතෙක් පැමිණ කුඩා ගෙයක් කුලියට ගෙන මේ ගමේ මිනිසුන්ට ප්‍රතිකාර කිරීමේ

සේවයක් ආරම්භ කෙළේය. ඔහු මේ ගම්වැසියන්ට කිට්ටුව ඔවුන්ගේ කෑම කමින් ඔවුන් මෙන් ජීවත් වෙමින් ඔවුන් අතර විසුවේය. ඔවුන් ඇසුරු කෙළේය. ඔවුන්ට උපස්ථාන කෙළේය. ඒ දුගී මිනිසුන්ට ඔහු දැක්වූ කරුණාවන්තකම හා හිතවත්කම ක්‍රම ක්‍රමයෙන් ඒ අවට ගම්වලට ද ඉන් පසුව රට පුරාම ද පැතිරිණි. මුළු රටම මේ යහපත් වෛද්‍යවරයාට ප්‍රිය කළහ.

රජ කුමරුට සිංහාසනාරූඪ වීමට වේලාව එළඹුණු කල ඒ දුගී ගමේ උපස්ථාන කළ වෛද්‍යවරයා මේ පුත් කුමරු බව ද දැන් රටේ රජකමට පත්වුණු බවද හෙළි කෙළේය. ඒ ගම අත්හැර දැන් ඔහුට අගනුවරට ද රජමැදුරටද යන්ට සිදුවිය. නමුත් තම රජතුමා සිය රටවැසියන්ට ආදරය කරන, සලකන බව සියල්ලෝම දැන් හොඳට දනිති. ඒ නිසා ඔහුට ප්‍රිය කරති. මැවුම්කරුන් වහන්සේ මෙලොවට පැමිණියේ රජ කුමරා දෙවෙනි වර ආ අයුරුය. එනම් දිව්‍ය තේජස, යස ඉසුරු අත්හැර සාමාන්‍ය කාන්තාවකගේ කුසයේ දරුවෙකු වශයෙන් සෑදී මෙලොවට පළමු නත්තල් දින බිහිවූ සේක. ඒ දරුවා යේසුස් වහන්සේය. යේසුස් වහන්සේ ස්වර්ගයේ සිට මෙලොවට වැඩියේ මිනිස් කයක් දරාගෙන ඔබ හා මා වැනි මිනිසෙකු වශයෙනි.

## 2. මැවුම්කරුන් වහන්සේ කියන්නේ කාටද?

උන්වහන්සේ තිබුණාවූ පවතින්නාවූ, මතු පවතින්නා වූ හා ඇතිවන්නාවූ සියල්ල නිර්මාණය කළ පරමාත්මයාණෝය. උන්වහන්සේ ජීවමාන, සප්‍රාණික, විශාරද චින්තනයක් ඇති සියළු සත්වයන්ට මෛත්‍රිය කරන, අපට කථා කිරීමට පුළුවන්, අප කථා කරන දේ ඇසෙන, අප කරන දේ දකින බලවේගයකි. පරම චේතනාවය. චේතනාවේ උල්පතය. උන්වහන්සේ මනුෂ්‍යයා වැනි සීමිත කෙනෙක් නොවේ. මනුෂ්‍යත්වයට වඩා බොහෝ උසස් වූ, උත්කෘෂ්ඨ වූ ශුද්ධ ආත්මයකි. එක සූයර්යාගේ එළිය සෑම

තැනම එක වේලාවටම පවතින ලෙසම උන්වහන්සේට සෑම තැනම එකවරම වැඩ වාසය කළ හැකිය. උන්වහන්සේට අතීතයද, අනාගතයද, වර්තමානයද වෙන්ව එක්වරම පෙනේ. මන්ද උන්වහන්සේ කාලයට ඉහළින් සිටිති. උන්වහන්සේ පරමාත්මයාණෝය. උන්වහන්සේට පෙර කිසිවක්වත්, කිසියම් තැනැත්තෙක්වත් නොසිටියේය. එබැවින් උන්වහන්සේ කිසිවකු හෝ කිසි දෙයක් විසින් හෝ නොසෑදිති. උන්වහන්සේ හරියට ගණිතයේ 1 අංකය වැනිය. එක සාදන්ට නොහැකිය. එක තිබිය යුතුමය. එය නැතිව වෙන කිසියම් ගණනක් සාදන්නට නුපුළුවන. එය ද වෙන කිසිවකින් සෑදිය නොහැක. උදාහරණය: 25 සෑදෙන්නේ 1 ඒවා 25 කිනි. 2 සෑදෙන්නේ 1 ඒවා දෙකකිනි. නමුත් 1 සෑදිය නොහැක. එය තිබිය යුතුමය. 1/2, 1/4 යනාදිය සෑදීමට (එක) 1 අවශ්‍යමය. එසේම පරමාත්මයාණෝද වැඩ සිටිය යුතුමය. උන්වහන්සේ නැතිව වෙන කිසිවක් තිබිය නොහැකිය. අන් සියල්ලම සෑදුවේ උන්වහන්සේය. ඒ නිසයි උන්වහන්සේ මැවුම්කරුන් වහන්සේ වන්නේ.

තවද, මේ අනර්ඝ විශ්වයේ පුදුම සැලැස්මක් තිබෙන බව ද ඒ ලෝකවල් ශාස්ත්‍රානුකූලව ක්‍රියා කරන බවද විද්‍යා විශාරදයින් සොයාගෙන තිබේ. අපේ අත් ඔරලෝසුවකට වඩා ශාස්ත්‍රානුකූලව මේ විශ්වය ක්‍රියා කරන බව ඔවුහු අපට කියති.

ඔරලෝසුව ඉබේ සෑදුනේ යයි, එය සාදන්නෙක් නැතැයි යමෙක් ඔබට කීවොත් ඔබ එය විශ්වාස කරන්නෙහිද? ඔබ කියවන මේ පත්‍රිකාව අච්චු කන්තෝරුවක බෝම්බයක් පිපිරී-මෙන් අකුරු එකතු වී ඉබේ සෑදුනු වචන ගැලපීමක් කියා මා කීවොත් ඔබ එය පිළිගන්නෙහිද? ඔබ වනයේ ඇවිදින කල හදිසියේ ඉතා අලංකාර මාළිගයක් දුටුවොත් එය ඉබේ සෑදුනේ යැයි නැත්නම් වනයේ මෘගයන් තැනූ ගොඩනැගිල්ලකැයි ඔබ සිතන්නෙහිද?

ඔරලෝසුව හෝ වාක්‍ය රචනයක් හෝ මාළිගයක් හෝ තැනීමට නිර්මාණ ශක්තියක් ඇති සාදන්නෙක් අවශ්‍යය. ඔරලෝසුවකටත් වඩා ශාස්ත්‍රානුකූලව ක්‍රියා කරන මේ විශ්වය ඉබේ සෑදුනේ යයි ඔබ විශ්වාස කරන්නේ කෙසේද? එය සෑදීමට නිර්මාණ ශක්තියක් ඇති විශාරද බුද්ධියක් ඇති සාදන්නෙක් අවශ්‍යය. ඒ තැනැත්තා මැවුම්කරුන් වහන්සේය.

මේ මැවුම්කරුන් වහන්සේ බයිබලය යන පොතක් අපට දී එමගින් මනුෂ්‍යයාට අනාවරණය වී තිබේ. තවද උන්වහන්සේම මෙලොව වැඩ අවුරුදු 33 ක් මනුෂ්‍ය ජීවිතයක් ගත කරමින් අපට තේරුම් ගත හැකි අන්දමකින් අප අතර වාසය කළහ. ඒ මනුෂ්‍යයා යේසුතුමාය. යේසුතුමා මැවුම්කරුන් වහන්සේගේ ඡායාවය. ප්‍රතිබිම්බයය. ස්වරූපයය. ප්‍රකාශවීමය. මනුෂ්‍යත්වය හා මනුෂ්‍ය රූපය ගත් පරමාත්මයාණෝය. මේ නිසයි උන්වහන්සේ මනුෂ්‍යයාගේ අකුසල් අහෝසි කරන විමුක්ති දයකයාණන් වන්නේ. මේ නිසයි උන්වහන්සේට මනුෂ්‍යයාගේ ප්‍රශ්න විසඳ දී ඔහු සපුරාලන්ට පුළුවන් වන්නේ. මේ නිසයි මනුෂ්‍යයා උන්වහන්සේට අයිති වන්නේ, උන්වහන්සේට ස්වාමීන් වහන්සේ කියා අමතා උන්වහන්සේගේ ස්වාමීත්වයට භාරවිය යුත්තේ; උන්වහන්සේට නමස්කාර කළ යුත්තේ; උන්වහන්සේ ඔබට මෛත්‍රිය කරති; ඔබට පිහිටවීමට පුල පුලා සිටිති; ඔබට සමීපව සිටිති.

## 3. කුරුසියේ ආරම්භය

තරුණයෙක් හා තරුණියක් ප්‍රේමයෙන් බැඳුනු කල ඔවුහු විවාහ වී ඒ ප්‍රේමයේ නියම තෘප්තිය හා රස විඳීමට බලපොරොත්තු වෙති. ඔවුන් එකිනෙකා දෙස බලා සිටීමෙන් හෝ පෙම් හසුන් හුවමාරු කර ගැනීමෙන් පමණක් සෑහීමකට පත්වන්නේ නැත. ඔවුහු හැකි පමණ ඉක්මනින් යුග දිවියක් ගත

කරන්නට අදහස් කරති. සාමාන්‍ය වශයෙන් මෙහි ප්‍රතිඵලය දරු ඵලය ය. බොහෝ නවක ජෝඩු දරුවන් නොලැබ සිටින්ට මුලදී අධිෂ්ඨාන කරන නුමුත් වැඩි කලක් යන්ට පෙර දෙදෙනාම දරුවන් පමා නොවී ඕනෑ යයි කියා ඔවුන්ගේ මුල් අධිෂ්ඨානය ඉවත ලා දරුඵල පතති. මෙයට හේතුව නම් ප්‍රේමයේ රසබරකම භුක්ති විඳින අයට එහි ප්‍රතිඵලයද දකින්ට ආශාවක් ඇති වීමයි. ඒ ප්‍රේමය නිසා දෙදෙනාගේ එකතුවීමේ නිෂ්පාදනයක් වශයෙන් දරුවකු පැමිණවීම ඔවුහු පතන්නෝය.

අඹු සැමි දෙදෙනාම දරුවෙකු ඉතා ආශාවෙන් ආදරයෙන් මේ ලෝකයට බිහි කරන්නට සූදනම් කරන අතරද ඒ අහිංසක දරුවා ඇතුළත් වන මේ ලෝකය හා සමාජය දරුවෙකුට බාධා සහිත අහිතකර එකක් බව දනිති. දරුවාට ලෙඩ දුක්, හිරිහැර කරදර ද දූෂ්‍ය වීමට ඉඩ ප්‍රස්තාව ද තිබෙන බව ඔවුහු දනිති. එසේ වුවත් දෙදෙනාගේ ප්‍රේමයේ ප්‍රතිඵලයක් වශයෙන් දරුවෙකු ලබා ගැනීමට ඔවුන් මගහරින්නේ නැත. ඒ ලැබෙන දරුවාගේ සුරක්ෂිතභාවය පිණිස කළ හැකි සියළුම පිළියම්ද, යම් අහේතුවක් සිදුවූ කල කළ යුතු ප්‍රතිකර්ම ද ඔවුහු කලින් සූදනම් කර ගනිති.

හොඳ පරිසරයක පදිංචියට ගොස් සුහද වටපිටාවක් ඔවුහු පිළියෙල කර ගනිති. හොඳ පාසලකට දරුවා ඇතුල් කර ගැනීමට කටයුතු යොද ගනිති. වලක්වා ගත හැකි රෝගවලින් බේරා ගැනීමට අත් එන්නත් කිරීම යනාදිය නොපමාව සිදු කරවා ගනිති. උදර ආබාධ වැනි දේට අවශ්‍ය ග්‍රයිප් වතුර යනාදිය ද හිස රුදවට ඕඩිකොලොන් හා තෙල් ද සීතල දිනකට උණුසුම් ප්ලැනල් කමිස, බූල් මේස් කකුල් යනාදිය ද කලින් පිළියෙල කර ගනිති. මේ ආදී වශයෙන් දරුවෙකුගේ ශුභ සිද්ධිය හා සුවය පතා සියල්ල කළ හැකි පමණින් කලින් පිළියෙල කර ගනිති.

මැවුම්කරුතුමන් ද මනුෂ්‍යයා මවා මේ ලෝකයේ තැබුවේ මෙසේය. මනුෂ්‍යයා කරගන්නා මෝඩකම දැනගෙන ඔහුට

සිදුවන විපත දැනගෙන ඒ සඳහා අවශ්‍ය පිළියම් සලසා පිළියෙල කොට උන්වහන්සේ මනුෂ්‍යයා මැවූ සේක. එය උන්වහන්සේගේ මෛත්‍රියේ ප්‍රතිඵලය යි. උන්වහන්සේ මෛත්‍රියේ නැනැන්වහන්සේ බැවින්, මෛත්‍රියේ උල්පත බැවින්, මනුෂ්‍යයා මැවූ සේක. එය උන්වහන්සේගේ මෛත්‍රියේ ප්‍රතිඵලයකි. මනුෂ්‍යයා වැටෙන පරිහානිය හා ඔහු හිතුවක්කාර වන බව දැනගත් නමුත් උන්වහන්සේ මනුෂ්‍යයා මැවූ සේක. පෙම්වතුන් දෙදෙනෙකු පැමිණිය හැකි, බලාපොරොත්තු විය හැකි දුෂ්කරතා, අහිතකර දේ තිබියදීත්, විවාහ නොවී දරුවෙකු නොලැබ නොසිටිනු වැනිය. මනුෂ්‍යයා එය දන්නේ අනුමාන වශයෙනි. නමුත් උන්වහන්සේ එය පැහැදිලි ලෙස දැන සිටියහ.

මනුෂ්‍යයාට සිදුවන මේ විපතට මැවුම්කරු තුමන් පිළියෙල කළ පිළියම නම් තමන්ම මෙලොවට පැමිණ මනුෂ්‍යත්වය රැගෙන තම ජීවිතය මනුෂ්‍යයන් වෙනුවෙන් පූජාවක් වශයෙන් පරිත්‍යාග කිරීමය. උන්වහන්සේ මේ ලෝකයට පැමිණ මනුෂ්‍යත්වය රැගෙන මැද පෙරදිග රටක් වන යෙරුසලමේ මනුෂ්‍යයෙක් වශයෙන් ජීවත් වූහ. ධර්ම වාක්‍යයේ වාර්තා කර තිබෙන්නේ ලෝකයේ අත්තිවාරම් ලන්ට පෙර පූජාවක් වශයෙන් යේසුස්වහන්සේ පූජා කරන ලද බවය. *(1 පේතෘස් 1-20 එළිදරව් 5:12)* එහි අර්ථය නම් මනුෂ්‍යයාගේ නිදහස හෙවත් විමුක්තිය හා දුවය සඳහා ඉදිරියෙහි දී ඒ පූජාව සිදු කරන බව හා එය මනුෂ්‍යයා මවන්ටත් පෙර පිළියෙල කළ බවයි.

තවද, මනුෂ්‍යයා මැවුම්කරු තුමන්ට අකීකරු වී කැරලිකාරව, උන්වහන්සේගෙන් අයින් වී, නිදහස් වී බැහැරව ගිය කල ඔහුගේ මුල් තේජසින් ඔහු වැටින. එබැවින් ඔහු නිරුවත් බව දැනී නග්නකම වසා ගත්තේය. ඔහුගේ පිරිහීමට පෙර ඔහුට වැස්මක් අවශ්‍ය නොවීය. මක්නිසාද ඔහු මත තිබුණු දිව්‍ය තේජස ඔහුට වැස්මක් මෙන් විය. නමුත් දැන් ඒ තේජස පහව යෑම නිසා ඔහුට ඇඟ වැස්මක් අවශ්‍ය විය. නමුත් ඔහු තනාගත් කොළ ඇඳුම

ඉක්මනටම මැලවී වියළී යන්නේය. මනුෂ්‍යයාගේ අඩුපාඩුකම් පිරිමසා ගැනීමට දරන සෑම ප්‍රයත්නයක්ම මෙවැනිය. ඒ අවස්ථාවේදී මැවුම්කරුතුමන්ම මැදිහත් වී මරණ ලද සතෙකුගේ සම ගෙන මනුෂ්‍යයාගේ නග්නකම වසා ගැනීමට ඔහුට වැස්මක් සාද දුන්හ. මේ සතාගේ මරණය යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ පූජාවේ පූර්ව ප්‍රතිරූපාදර්ශයකි. එනම් කලින් පිළිබිඹු කිරීමකි. මනුෂ්‍යයාගේ ප්‍රයත්නය දුර්වල බැවින් එනම් කොළවලින් තනාගත් වැස්ම වියළී ගොස් නොපවතින බැවින් එය නිශ්ඵලය. එසේම තමා සුදනෙක් වීමට, තමාගේ අඩුපාඩුකම් සපුරා ගැනීමට දරණ ප්‍රයත්නයද නිෂ්ඵලය. එනිසා මැවුම්කරුතුමන් ම මෙලොවට පහළ වී  අප වෙනුවෙන් අප හට එය සිදුකර දිය යුතු විය. අවුරුදු දහස් ගණනකට පසුව සිදුකරන මේ අද්විතීය දේ මනුෂ්‍ය ඉතිහාසයේ මුලදීම උන්වහන්සේ මනුෂ්‍යයාට අනාවරණය  කළහ.

මනුෂ්‍යයා මැවුම්කරුතුමාට අකීකරු වීමෙන් ඔහු අධ්‍යාත්මික වශයෙන් මැරුණේය. ඔහු වටා ආවරණයක් මෙන් තිබුණ දිව්‍ය තේජස නැමැති දීප්තිය පහවී ගොස් ඔහු නිරුවත් බවට පත්විය. නිරුවත් බව ඔහුට පෙනී ගියේය. ඒ නිරුවත් කම සඟවා ගැනීම පිණිසයි ඔහු කොළවලින් වැස්මක් තබා ගත්තේ. නමුත් මෙය නිෂ්ඵල ප්‍රයත්නයක් විය. කොළ වහා වියළී යයි. නොපවතියි. එබැවින් ඔවුන්ට සම් ඇඳුම් සාද දෙන ලද්දේය. මෙය පූර්ව ප්‍රතිරූපාදෘෂ්‍යයකි.  එනම් යේසුස්වහන්සේ තම ජීවිතය පූජා කරමින් උන්වහන්සේගේ ජීවිතය හා තේජස වගුරුවා එයින් අප පැළඳීමේ, ආවරණය කිරීමේ නිරූපනය කිරීමකි. මැවුම්කරුතුමන්ගේ සිතෙහි හා සැලැස්මෙහි පිළියෙල කර තිබුණු මේ මහා පිළියම උන්වහන්සේ මේ පළමුවන ප්‍රතිරූපාදෘෂ්‍යයෙන් අනාවරණය කළහ. මෙවැනි නිදර්ශන රැසක් ඊශ්‍රායෙල් ඉතිහාසයේ උන්වහන්සේ ගෙනහැර දැක්වූහ. ඒවා ධර්ම ග්‍රන්ථයේ පරණ ගිවිසුම කොටසේ වාර්තා වී තිබේ. ඉතින් කුරුසියේ ආරම්භය මේ ලෝකයේ

අත්තිවාරම දමන්ට පෙර සිට මැවුම්කරුතුමන්ගේ ශුද්ධ අභිප්‍රායේ හා සිතෙහි ආරම්භ වූ බව අපට පෙනේ.

## 4. මනුෂ්‍ය මූලපතනය හා එහි ප්‍රතිඵලය

මැවුම්කරුතුමන් මැවූ මේ ලක්ෂණ සෞභාග්‍යමත් ලෝකයේ මනුෂ්‍යයා ද මවා ප්‍රීතියෙන් තෘප්තියෙන් ජීවත්වීමට උන්වහන්සේ මනුෂ්‍යයා එහි පදිංචි කළහ. ඔහු හා සමාන සහකාරියක් ඔහුට මැවුම්කරුතුමා සාද දුන්හ. උන්වහන්සේ හා සමඟ මිත්‍රකමින් ආශ්‍රය කිරීමට ඔවුන්ට වරප්‍රසාදය තිබිණ.

මැවුම්කරුතුමා මිනිසාට භාර්යාවක් සපයා දුන්නේ මිනිස් වර්ගයාගේ බෝවීම පිණිස පමණක් නොවේ. නමුත් මිනිසාගේ ද ප්‍රීතිය හා සම්පූර්ණත්වය පිණිසය. තවද ඒ සඳහා එක බිරිඳක් ප්‍රමාණවත් නිසා උන්වහන්සේ ඔහුට දුන්නේ එක බිරිඳකි. ඕනෑම දියුණු ශිෂ්ඨ සමාජයක විවාහයේ අද පවතින ඒක පුරුෂ සේවනය හා ඒක ස්ත්‍රී සේවනය යන ප්‍රතිපත්තිය මිනිස් ඉතිහාසයේ මුල සිට පවතින බව මතක තබා ගැනීම අපට හොබනේය. මේ මුල් අඹු සැමි යුවළ සමානාත්ම දෙදෙනෙක් බවද ඉහත කී සාධකයෙන්ම පැහැදිලි වේ. නූතන යුවතිපතීන් ද අප මුල් දෙමව්පියන්ගේ ආදර්ශය ගැනීම යුතුය. අප මුල් පියා මෙන් සැම සැමියාම තම අඹුවට "ඔබ මාගේ මාංශයෙන් මාංශය ය, මාගේ ඇටවලින් ඇටය" කියමින් ලබැදියාවෙන් හා ඇල්මෙන් පිරී සිටිය යුතුය. අඹු සැමි දෙදෙන එකින් එකා සමඟ මිත්‍රකමින් සිටින අතර මුල් යුවල මෙන්ම මැවුම්කාරතුමා සමඟද මිත්‍රකමින් ආශ්‍රය කළ යුතුයි. මේ මිත්‍රකම ඉබේම අපට නැති බවද ඒ ඇසුරට ඇතුල්වීම පිළිබඳ කරුණුද මීට පසු පරිච්ඡේදයක සඳහන් කර තිබේ.

මේ මුල් යුවල මැවුම්කරුතුමාණන් හා සමඟ ද මිත්‍රව සිටියහ. එය ඔවුන්ගේ ස්ව කැමැත්තෙන් ඔවුහු කළහ. ඔවුන්

නිදහස් කැමැත්තක් සතුව මවා තිබිණ. මේ නිදහස් කැමැත්ත ක්‍රියාවේ යෙදවීමට පුළුවන් වන පිණිස එනම්, ඔවුන්ට තම කැමැත්තෙන් කීකරු වීමට හෝ එසේ නොකිරීමට හෝ නියෝගයක් නැතහොත් සීමාවක් මැවුම්කරුතුමන් විසින් තබන ලදී. එනම් ඔවුන් වාසය කළ උයනේ එක ගසකින් පමණක් ගෙඩි කෑම තහනම් වීමය. ඔවුන්ට උයනේ මේ ගසින් හැර අනෙක් ඕනෑම ගසකින් ගෙඩි කෑමට අවසර තිබිණ. මෙය හරියට ගෙයක් ඇතුළත සිටින දරුවාට පියා පිටතට යන කල පිටතට නොයන්න කියා දොර වසා නොතැබීම වැනිය. පියා නැවත ගෙදර එන කල දරුවා කීකරු නම් ඔහු තවමත් ගේ තුළ සිටියි. අකීකරු නම් පිටත සිටියි. නමුත් පියා දොර වසා දමා එසේ ගියේ නම් දරුවාට කීකරු වීමට හෝ අකීකරු වීමට හෝ නිදහසක් නැත.

උයන මැද තිබුණු ඒ ගසෙන් කෑම තහනම් කරන ලදී. ඔවුනට කෑම පිණිස විවිධ පළතුරු පලා වර්ගද ඒ උයනේ තිබුණි. එම නිසා ඔවුනට එම තහනම් ගසෙන් ගෙඩි කෑමට කිසිම අවශ්‍යතාවයක් නොතිබිණ. ඔවුහුද ඒ ගෙඩි කෑමට අවසර නැතිවූ නමුත් අනෙක් සියල්ලෙන් ඉතා සතුටු වී තෘප්තිමත් වී සිටියහ. එකල උයනේ දක්නට තිබුණේ ඉතා සෞභාග්‍යසම්පන්න, සෞම්‍ය, අලංකාර දර්ශණයකි. ඉතා යහපත් ලෝකයකි. මෙවැනි යහපත් දර්ශණයකට ඉතා ඊර්ෂ්‍යායා කරන, අප්‍රිය කරන මැවුම් කරුතුමන්ගේ සියලු දේට විරුද්ධකාර තැනැත්තා වන සාතන් හෙවත් යක්ෂාධිපතියා මේ ලක්ෂණ දර්ශණය අවලක්ෂණය කිරීමට එහි පැමිණියේය. මනුෂ්‍යයා වාසනාවන්තව සිටීම දක්නට ඔහු කැමති නැත. මේ ලෝකයේ අවාසනාවන්තකමට මුල් හේතුව ඔහුය. එසේය, දැන් පවතින සියලු අවාසනාවන්තකමේ මුල් කර්තෘ වන ඔහුගේ උපක්‍රමයෙන් මුළාවී අප බොහෝ විට අපේ මුරණ්ඩුකම් හා අඥානකම් නිසා අපම අවාසනාවන්තකම ළඟාකර ගන්නෙමු.

# 5. යක්ෂයාගේ ආරම්භය

යක්ෂාධිපතියා හෙවත් සාතන් වරක් යහපත්ව සිටි අලංකාර ස්වර්ගික දූතයෙකි. ඔහු වරක් සවර්ගයේ ඉතාම උතුම් ස්ථානයක් දැරූ 'දීප්තිමත් පහන් තරුව', 'අළුයම පුත්‍රයා' *(යෙසායා 14:12)* යනුවෙන් වර්ණනා කරන ලද, "සම්පූර්ණකම මුද්‍රා කරන්නාවූ ප්‍රඥාවෙන් පිරී, අලංකාරකමෙන් පරිපූර්ණ වී සිටියේය" *(එසකියෙල් 28:12)* යනුවෙන් විස්තර කරන ලදී. එසේම ඔහු මැවුම්කරුතුමන් විසින් මවන ලද සියල්ලෙහිම ශ්‍රේෂ්ඨතම විශිෂ්ඨතම ස්ථානය දැරූ ලූසිපර් නම් උත්තමයා වූහ. නමුත් ඔහු මැවුම්කරුතුමන්ට විරුද්ධව කැරලි ගසා ඔහුද ඔහුගේ දූත පිරිස එනම් ස්වර්ගික දූත සංඛ්‍යාවෙන් තුනෙන් පංගුවක් (එළිදරව් 12) වන ඔහුගේ පක්ෂයට අයිති පිරිසද ස්වර්ගයෙන් නෙරපා දමනු ලැබූහ. කලින් ස්වර්ගයේ සිටි, පොළොවට යමින් එමින් මැවුම්කරුතුමාගේ මෙහෙවර කළ මේ පිරිස පොළවට පමණක් සීමා විය. මේ ලූසිපර් සහ ඔහුගේ දූත පිරිස දැනට යක්ෂාධිපතියා හා යක්ෂ සේනාව වී මෙලොව ක්‍රියා කරති. සාතන් මේ ලෝකයේ දෙවියන් හා අධිපතියා වශයෙන් හැඳින්වේ. ඔහු සහ ඔහුගේ දූත පිරිස දෙවිවරුන් වශයෙන් හඳුන්වා ගැනීමටද මහෝත්තම ජීවමාන මැවුම්කරුතුමන්ට පමණක් හිමි නමස්කාරය මනුෂ්‍යයන් වූ අපෙන් ලබන්නටද ඉතා ආශා කරයි. මනුෂ්‍යයන් අධ්‍යාත්මික ලෙස අන්ධ කරමින් අවිද්‍යාවේ තබයි. සත්‍යය හා සියලු අධ්‍යාත්මික කරුණු ඔහුගෙන් සඟවා තැබීමට යක්ෂයා විධි විධාන යොදයි. නොයෙක් තැන්වල හා ගස්වල වෙසෙතියි කියමින් මනුෂ්‍යයන් තුළ ත්‍රාසය, භය උපදවයි. දර්ශණ, සිහින, හොල්මන් යනාදියෙන් මිනිසුන් බියපත් කරයි. බාධා පරීක්ෂා යනාදියෙන් මනුෂ්‍යයාට හිරිහැර කරයි.

අපේ රටේ බහුලව තිබෙන නොයෙක් මන්ත්‍ර ගුරුකම්, අනවින, කොඩිවින, හූනියම්, යක්ෂාවේශවීම් යනාදියෙන් මනුෂ්‍යයන්ට පීඩා කෙරෙයි. මහසෝනා, රීරියකා (බොකටු

කොල්ලා) යනාදී වෙස්වලින් යක්ෂයා හා ඔහුගේ පිරිස මිනිසුන්ට හඳුන්වා ගනිති. බලි, තොවිල්, බන්ධන කැපීම් යනාදියෙන් පිහිටවන මුවාවෙන් මනුෂ්‍යයා නොයෙක් අන්දමින් විශේෂයෙන් ආර්ථික ලෙස පෙලයි. බොහෝ අය මේ දේවල් නිසා ඉතා දිළිඳු තත්ත්වයට පත්වී ජීවිතාන්තයට ණය තුරුස් වී සිටිති. පේන කීම්, ශාස්තර කීම්, කනප්පු කරකැවීම් යනාදී නොයෙක් විවිධ යක්ෂ පීඩාවලින් මුලාකොට කොටවමින් තරහා කරවමින් පරම්පරාගත බද්ධ වෛර ඇති කරයි. ග්‍රහ අපල යනාදියේ ආරම්භයද යක්ෂයාය. ඈත අතීතයේ දී සෑම ග්‍රහයෙකු තුළම දේවතාවෙක් හෝ දේවතාවියක් හෝ සිටියි යන අදහස මනුෂ්‍යයන් තුළ ඇති කොට ඔවුන් මනුෂ්‍යයන් හා ඔවුන්ගේ ඉරණම කෙරෙහි බලපවත්වන්නේ යයි කියමින් ඔවුන් එවැනි මතවලට වහල් කරගෙන අද දින ජ්‍යොති ශාස්ත්‍රය නැමැති කලාවෙන් මනුෂ්‍යයන් තවදුරටත් කොටු කර බැඳ තබා තිබේ. මේ සියලු දේ යක්ෂයාගේ කූට උපක්‍රම හා ප්‍රබන්ධ වේ. මේ දේවල් යක්ෂයා යොදා තිබෙන්නේ මනුෂ්‍යයාට තිබෙන ආදරයට නොව ඔහු පෙළීමට හා ඔහු වහල් භාවයට පත් කිරීමටය. ඇතැම් විට මේ සමහරක් දෙයින් මනුෂ්‍යයාට යහපතක් නැතහොත් වාසියක් දෙන මුවාවෙන් තාවකාලික වාසියක් ගෙන දී ඔහු තවදුරටත් වහල් භාවයට පත්කරයි. මේ සියලු දෙයට යටත් වීමටත්, රැවටීමටත්, භය වීමටත් අනවශ්‍යය. අතගැසීමටත් නුසුදුසුය. මේ සියල්ල යක්ෂයාගේ ක්‍රියාය.

සාතන් හෙවත් යක්ෂයා ඔහුගේ පිරිස මැවුම්කරුන් වහන්සේගේ ආශ්‍රයේ හා වරප්‍රසාදයේ කලින් ස්වර්ගයේ දූතයන් මෙන් සිට පිරිහුනේ ඔවුන්ට නිදහස් කැමැත්ත තිබුණ නිසාය. මැවුම්කරුතුමන් ස්වර්ග දූතයන් මවන අවස්ථාවේදී ඔවුන්ද මැවුවේ බුද්ධිමත් නිදහස් කැමැත්ත ඇති පුද්ගලයින් වශයෙනි. උන්වහන්සේ ලනුවලින් ක්‍රියා කරන රූකඩ වැනි අය මැව්වේ නැත. උන්වහන්සේට එවැනි අය අවශ්‍ය නැත. උන්වහන්සේ මැව්වේ නිදහස් කැමැත්තක් ඇති නිවහල් පුද්ගලයන්ය.

යක්ෂයා සහ ඔහුගේ පිරිස කැරලි ගැසූ නිසා ඔහුගේ දඬුවම හා අවසාන වාසය වශයෙන් අපාය මවන ලදී. මැවුම්කරුතුමන්ගේ මුල් සැලැස්මේ අපායක් නොතිබිණ. නමුත් යක්ෂයා හා පිරිස සඳහා අපාය මැවුම්කරුතුමන්වහන්සේ පසුව සෑදූහ. ලෝකාන්තිමයේදී විනිශ්චය අවස්ථාවේදී සිදුවන දර්ශනයක් විස්තර කරමින් යේසුස්වහන්සේ මෙසේ පැවසූහ. "ශාප ලත්තෙනි, මා කෙරෙන් පහව යක්ෂයාටත් ඔහුගේ දූත පිරිසටත් සූදානම් කර තිබෙන සදාතනික ගින්නට යනු" - (මතෙව් 25:41)

## 6. මනුෂ්‍යයාගේ වැටීම

ඉතින් මේ අද්භූත, විශාරද, කපටි, සියලු නපුරේ හා බොරුවේ කර්තෘ වන සාතන් අප මුල් මව්පිය දෙපල වන ආදම් සහ ඒව සිටි උයනට පැමිණ ප්‍රයෝගයකින් හා බොරුවෙන් ඔවුන් මුළා කෙළේය. "ඔබට මේ ගස්වල ගෙඩි කන්නට එපා කියා තහනම් කර තිබෙනවා නොවේද?" කියා සැක උපදවමින් ඔහු ඇසුවේය. නමුත් ස්ත්‍රිය සැබෑ සාක්ෂිකාරියක් වශයෙන් එය පිළිගත්තේ නැතිව ඈ දැන සිටි ඒ කාරණය පිළිබඳ සත්‍යය ප්‍රකාශ කරමින් "අපට උයනේ ඕනෑම ගසකින් ගෙඩි කන්නට පුළුවන. එහෙත් මැද තිබෙන ඒ ගසෙන් පමණක් කෑ දවසෙහි ඔබ නසින්නෙහිය, කියා ස්වාමීන්වහන්සේ අපට වදාළහ"යි කීය. එකල යක්ෂයා ඊට හාත්පසින්ම විරුද්ධ දෙයක් ප්‍රකාශ කළේය. "ඇත්තටම ඔබ නසින්නේ නැත. ඔබ ඒ ගසෙන් කෑ දවසෙහි හොඳ හා නරක දැනීමේ ඥානය අත්කර ගන්නේය. ඔබ මැවුම්කරුතුමන් හා සමාන වන්නේය". මේ අවස්ථාවේදී ස්ත්‍රිය යක්ෂයාගේ මුසාවට රැවටී එය පිළිගත්තාය. යක්ෂයාගේ වචනයට සවන් දී එයට කීකරු විය. මැවුම්කරුතුමන්ගේ වචනය ප්‍රතික්ෂේප කළාය, එයට අකීකරු වූවාය. පුරුෂයාද එසේම කෙළේය. මෙයින් ඔවුන් දෙදෙනා මැවුම්කරුතුමන්ට විරුද්ධව කැරලි ගැසුවෝය. උන්වහන්සේගෙන් බැහැරව තම කැමැත්ත අනුව හිතුවක්කාර වූහ.

තහනම් කරන ලද ගසෙන් ගෙඩි කෑම වැනි ඉතා සුළු දෙයක් සුළුපටු නොවන බවද එය ඉතා බැරෑරුම් දෙයක් බවද මෙයින් පැහැදිලි වේ. මෙසේ ඔවුන් දෙදෙන මැවුම්කරුතුමන්ගෙන් නිදහස් වී ඉවත් වී උන්වහන්සේ හා සමඟ තිබූ සම්බන්ධය හා ඒකාබද්ධකම කැඩී බිඳී ගියේය. ඔවුන් ඒ මොහොතේ සිට අධ්‍යාත්මික ලෙස මැරුනි. ඔවුන් තුළ තිබුණු ජීවමාන නාමය අප්‍රාණික විය. මළානික විය.

නාමය යනුවෙන් හැඳින්වෙන්නේ මනුෂ්‍යයාගේ මමත්වය නොවේ. නමුත් ඔහුගේ නියම පුද්ගලික භාවයය. ඔහුගේ අමරණීය කොටසය. ඔහුගේ ශරීරය මරණයෙන් දිරාපත් වී ක්ෂය වී යයි. නමුත් මේ නාමය මරණින් මතු පවතියි. ඔවුන්ගේ නාමය අතුරුදහන් වූයේ නැත. නමුත් එය අප්‍රාණික තැනැත්තෙකු විය. එය ප්‍රානවත්ව තිබීමට අවශ්‍ය ජීවිතය නැති විය. ගසකින් අත්තක් කඩා දැමූ කල ඒ ගසෙහි ගලන ජීවය ඒ අත්තෙහි ගලන්නේ නැත. එමනිසා එය අප්‍රාණික වී මැල වී මැරී යන්නේය. එසේම මනුෂ්‍යයා මැවුම්කරුතුමන්ගෙන් වෙන්වූ කල උන්වහන්සේගේ ජීවිතය මනුෂ්‍යයා තුළ නැති විය. අතුරුදහන් විය. එමනිසා ජීවමාන ලෙස මවන ලද මනුෂ්‍යයා අධ්‍යාත්මික ලෙස අප්‍රාණික කෙනෙක් විය. ඔවුන්ගෙන් පවතින අප සියල්ලෝම, මුළු මනුෂ්‍ය සංහතියම අධ්‍යාත්මික ලෙස අප්‍රාණික වී, පාපය නැමැති විෂයෙන් විෂ මූර්ච්ඡා වී සිටිති. එම නිසා අප නැවත ජීවත් කළ යුතුව තිබේ.

විදුලි බල්බ් එකක් පත්තු වන්නේ එය තුළට විදුලි බලය ගලා ආ විටයි. ඒ බලය නතර කළ විට එහි ආලෝකය නිවී යයි. දැන් මනුෂ්‍ය නාමය හරියට විදුලි බලය නැති විදුලි බල්බ් එකක් වැනිය. දැන් මනුෂ්‍යයා මළානික නාමයක් වශයෙන් නියම ජීවනය නැතුව නිදැල්ලේ ජීවත් වී තෘප්තියක් අරමුණක් නැතුව ජීවත් වී, අතරමං වූවෙක් වශයෙන් මුළු ජීවිත කාලයම ගතකොට ජීවනය නැතිව පරලොවට ප්‍රවේශ වන්නේය. ජීවනය නැතුව

ජීවත්වීමට හේතුව ජීවනයේ උල්පත වන මැවුම්කරුතුමන්ගෙන් බැහැරව සිටීමයි. යමෙක් උන්වහන්සේගෙන් බැහැරව සිට මෙලොවින් පරලොවට ගිය කලත් උන්වහන්සේගෙන් බැහැරවයි සිටින්නේ. උන්වහන්සේගෙන් බැහැරව සිටීම අපායයි. උන්වහන්සේ සමඟ සිටීම ස්වර්ගයයි, මෝක්ෂයයි.

මැවුම්කරුතුමන්ගෙන් වෙන්වී සිටීම, දිව්‍ය ජීවනය නැතුව අප්‍රාණිකව සිටීම මනුෂ්‍යයාගේ හිතුමනාපේ ක්‍රියා කිරීම් හා අහංකාරකමේ හා කැරලි ගැසීමේ ඵලවිපාකයයි, දඬුවමයි. දැන් මනුෂ්‍යයා යක්ෂයාගේ පක්ෂයට පත්වී වහල් වී, බැඳී සිටිති. මේ බලපෑම බිඳින්නටද ඔහුගෙන් අප නිවහල් කරන්නටද ඔහු සුණු විසුණු කිරීමටද උන්වහන්සේම මෙහි පැමිණ ක්‍රියා කරන බවට පොරොන්දු වූහ. උන්වහන්සේ එසේ කරන්නේ මනුෂ්‍යත්වය රැගෙන එයට ඇතුළු වූ, මනුෂ්‍යයෙකු වශයෙන්මය. එසේ කිරීමේදී උන්වහන්සේද පහර ලබන බව මුලදීම එළිදරව් කරන ලදී.

## 7. මනුෂ්‍යයාගේ වර්තමාන තත්ත්වය

මැවුම්කරුතුමා හා සමඟ තිබුණු සම්බන්ධකම බිඳුණු නිසා මනුෂ්‍යයා තනි පුද්ගලයෙකු වී ඔහු තුළ තනිකමක් හා පාලුවක් ඇති විය. හිස් භාවයක්ද දැනේ. තවද ඔහු තමකම්න් පිරුණු ආත්මාර්ථකාමී පුද්ගලයෙකු විය. ඔහු හිතුවක්කාර, තමාගේ වාසිය, ලාභය හා සතුට සොයන, තන්හා සහගත පුද්ගලයෙකු විය. ඔහු තුළ දැන් දිව්‍ය ජීවනය නැත. ඔහු අවිද්‍යාවෙන් පිරී සිටියි.

එබැවින් සැබෑ සත්‍යයන් ඔහුට ඔහුගේම බුද්ධියෙන් වටහා ගැනීමට නුපුළුවන. මැවුම්කාරතුමා ගැනද තේරුම් ගැනීමට නුපුළුවන. තමා අතින් සිදුවන අකුසල්වල බැරෑරුම්කම වැටහෙන්නේවත් නැත. නමුත් තිරිසනෙකු නොවන නිසා ඔහුට හරි වැරදි තේරෙයි. ඔහුට හෘදය සාක්ෂියක් තිබේ.

නමුත් හරි දේ කිරීමට බාධාව ඇලිමැලි දුබලකමය. එසේ කිරීමට ඔහුට ශක්තිය නැත. ඔහුට අධ්‍යාත්මික රෝගයක් තිබේ. එනම් අධ්‍යාත්මික ඇලිමැලි දුබලකමය. ඊට ධර්ම ග්‍රන්ථයේ කියා තිබෙන්නේ ආත්මික මරණය කියාය. එනම් අප සෑම කෙනෙකුම සිටින්නේ ආත්මික වශයෙන් මලාතිකවය. මැරිලාය. මෙය සහජයෙන්ම අප සියලු දෙනාගේ ආත්මික තත්ත්වය ය. මේ රෝගය සහජ රෝගයකි. එබැවින් මේ රෝගයෙන්, රෝගීව සිටින බැවින් අපට මැවුම්කරුතුමන් දැනගැනීමට හා යහපත් ආත්මික ක්‍රියාවක් කිරීමට ශක්තියක් නැත. මේ රෝගයට පාපය කියාද ධර්ම ග්‍රන්ථයේ සඳහන් වේ. අප අතින් සිදුවන අකුසල් මේ රෝගයේ රෝග ලක්ෂණ පමණය. එමනිසා මේ රෝග ලක්ෂණ පමණක් ඉවත් කිරීමට නැත් කිරීම උණ රෝගය තිබෙන කෙනෙක්, ඇගේ උණුසුම්කම ඉවත් කිරීමට ඇඟ සීතල කර ගැනීම වැනිය. මනුෂ්‍යයා තුළ තිබෙන පාපය නැමැති රෝගයේ රෝග ලක්ෂණ විවිධාකාරය. සිල්වත් වැදගත් උගත් මනුෂ්‍යයා තමා තුළ තිබෙන පාපය නැමැති රෝගයෙහි රෝග ලක්ෂණ ඉතා අඩු කරගෙන (ස්වල්පයක් කරගෙන) හෝ මුවා කරගෙන ඇත. වෙනත් අය නූගත්කම නිසා හෝ නරක ඇති දැඩි වීම නිසා හෝ රෝග ලක්ෂණ බහුලව දක්වයි. අකුසල් කරන අය වන අපේ ප්‍රශ්නය වන්නේ අප සියල්ලන්ගේ පොදු රෝගය වන පාපයයි. අප සියල්ලන් තුළ මේ අභ්‍යන්තර රෝගය තිබෙන නිසා අප සියල්ලෝම පාපතරයෝය. පාපතරයන්ට හිමි විපාකය අපායය.

මනුෂ්‍යයා මෙසේ රෝගියෙක් නිසා ඔහු ආත්මික වශයෙන් ඉතා දුර්වලය. ඔහුම අධිෂ්ඨාන කරන දේ පවා ඔහුට පිළිපැදිය නොහැකිය. තමා නොකළ යුතු යයි දන්නා දෙයම තමා අතින් සිදුවෙයි. තමා කළ යුතු යයි සිතන දේ පවා තමා අතින් සිදුවන්නේ නැත. එම නිසා පරාජිත භාවයක් හා කලකිරීමක් පවතියි.

මනුෂ්‍යයා ඒ අතරම තම මැවුම්කරුතුමාට විරුද්ධව

සතුරුව සිටියි. මේ සතුරුකම බොහෝ විට මනුෂ්‍යයාට පෙනෙන්නේ නැත. නමුත් දේව කැමැත්තට පටහැනිව ක්‍රියාකිරීම, දේව කැමැත්ත සොයා විසඳ නොගැනීම හෘදය සාක්ෂියට විරුද්ධව ක්‍රියා කිරීම යනාදී දෙයින් හා අපට බොහෝ රුචි දේ කිරීමට ඉඩ නොලැබීමේ දී අප තුළ ඇතිවන දුකෙන් ද දේව නීතිය අපෙන් තරයේම ඉල්ලා සිටින දෙයට අප දැඩි ලෙස විරුද්ධවීම යනාදී දෙයින් මෙය පැහැදිලි වන්නේය. අපට වරද කරන අයට අප සමාවිය යුතුයි, අප ආදායමෙන් දශයෙන් කොටසක් උන්වහන්සේට පූජා කළ යුතුයි, සතුරන්ට මෛත්‍රිය කළ යුතුයි, යනාදී යුතුකම් අප ඉටු කරන්නේ නැත. ඉටු කරන්නට කැමති වන්නේත් නැත. ඉතින් අප මෙසේ අපේ පරම යුතුකම ඉටු කරන්නේ නැතිව අප ධාර්මික යයි කියන්නේ කෙසේද? එය සම්පූර්ණ ආත්ම වංචාවකි. තමාම මුලා කර ගැනීමකි. නමුත් බොහෝ ආගමික අය සිටින්නේ මේ තත්ත්වයේය. තමා ආගමික වත් පිළිවෙත් රැසක් කරන නිසා තමා යහපත් යයි සිතා ගනියි. සෙසු අය සමඟ සසඳගෙන තමා අනුන්ට වඩා බොහෝ හොඳ යයි සිතා ගනිති. නමුත් තමා ගැන අවංක තත්ත්වාබෝධයක් ලබාගත් කල තම ජීවිතයෙහි නීරස භාවයද අරමුණක් නැති බවද තමාගේ අතරමං තත්ත්වය ද පෙනෙනු ඇත.

මේ ඉහත කී මනුෂ්‍ය ප්‍රශ්නවලට හේතුව මමත්වය හා එය කෙරෙහි බලපවත්වන පාපයයි. මෙසේ පාපයෙන් රෝගී වූ මේ මමත්වය සෑම වේලේම තම වාසිය හා පහසුව තකා ක්‍රියා කරයි. මමත්වය කිසි දිනක මමත්වයට විරුද්ධව හෝ පාඩුවන අන්දමට හෝ ක්‍රියා නොකරයි. මමත්වය රැකගැනීමට එයම ක්‍රියා කරයි. මේ නිසයි, මනුෂ්‍යයාගේ මූලික ප්‍රශ්නය තමාටම විසඳ ගැනීමට නොහැකි. මේ නිසා මනුෂ්‍යයාට පිටතින් පිහිටක් අවශ්‍යයි. තමාට පිටතින් සරණක් අවශ්‍යයි. අපේ ගැලවීමට, විමුක්තියට, ගැලවුම්-කරුවෙක්, විමුක්තිදායකයෙක් අපට අවශ්‍යයි. ඇත්තෙන්ම අපව අපේම මමත්වයෙන් හා දුර්වලතා වලින් මුදගත යුතුයි.

මනුෂ්‍යයා මැවුම්කරුතුමාගෙන් වෙන්ව විරුද්ධ පක්ෂයේ සිටින නිසා ඔහු තුළ විශාල අසහනයක් පවතී. මේ අසහනයෙන් නිදහස් වීමට නම් මැවුම්කරුතුමා ඉදිරියේ මනුෂ්‍ය සිතේ අභ්‍යන්තරයේ තිබෙන දෝෂාරෝපණයට උන්වහන්සේගේ දේව කමාව අත්කර ගත යුතුයි. මේ සමාව අත්වුණු කල අභ්‍යන්තර සාමයක් ද ඇතුළත ප්‍රීතියක්ද ඇතිවේ. මේ කමාව දෙන්නේ කෙසේද?

## 8. විමුක්තිය නොහොත් දේව කමාව

අප කරන සියලුම වැරදිවලට ඵල විපාකයක් තිබේ. එය නියම කර තිබෙන්නේ මැවුම්කරුතුමන් විසිනි. යම් වරදකට නිසි ඵල විපාකය විනිශ්චය කරන්නේ මැවුම්කරුතුමන්ය. එයට හේතුව නම් අපි කරන සියලු වැරදි හා අකුසල් උන්වහන්සේගේ නියෝගයක් කඩ කිරීමක් හෝ අතපසු කිරීමක් හෝ වන නිසාය.

මැවුම්කරුතුමා සාධාරණ නිසා සියලුම වැරදි සාධාරණ ලෙස විනිශ්චය කළ යුතුමය. මේ ලෝකයේ කිසි විනිශ්චයකාරතුමෙකු යුක්ති සහගතව විනිශ්චය නොකරන්නේ නම් අපි ඔහුට අසාධාරණ තැනැත්තෙක් කියා කියමු. ඊට විරුද්ධව උද්ඝෝෂණයක් ද කරමු. එබැවින් වරදකරුවන්ට දුර්විපාක දීම සාධාරණය. මැවුම්කාරතුමාගේද යුතුකමය.

නමුත් එතුමා අපට බොහෝ මෛත්‍රිය කරති. එමනිසා උන්වහන්සේ දුර්විපාක දීමට ප්‍රිය කරන්නේ නැත. යම් කෙනෙකු විමුක්තිය ලබා ඵල විපාකයෙන් නිදහස් වීමයි උන්වහන්සේගේ සතුට. අප සියලු දෙනාම අකුසල්කරුවන් වන හෙයින් උන්වහන්සේගේ සාධාරණත්වය අනුව අපට දුර්විපාක දිය යුතු නමුත් උන්වහන්සේගේ මෛත්‍රිය නිසා උන්වහන්සේ අප මුදා ගැනීමට සතුටුය. එබැවින් උන්වහන්සේගේ මෛත්‍රිය නිසා එය තමා පිටට පවරාගෙන ඒ දුර්විපාකය අප වෙනුවෙන් දරා ගත්තාසේක.

එය හරියට උසාවියේදී දඬුවම් නියම කරන විනිශ්චයකාර-තුමා තම ඥාති දරුවාට අවුරුදු 5 ක සිර දඬුවමක් හෝ රු.5,000 දඩයක් හෝ ඒ වරද අනුව නියම කොට, ඉන්පසු ඔහු විනිශ්චයාසනයෙන් බැස ඇවිත් ඒ දඩය ගෙවා වරදකරුවා නිදහස් කර යැවීම වැනිය.

තවත් නිදර්ශනයක් ගනිමු. දිනක් පාසල් ශිෂ්‍යයෙක් ගලක් විසි කරද්දී එම ගල පාසලේ ප්‍රධාන ශාලාවේ වීදුරු දොරක වැදී වීදුරුව බිඳෙයි. ප්‍රධානාචාර්යතුමාට මේ ශිෂ්‍යයාගෙන් දඩයක් අය කරන්ට පුළුවන; දඬුවම් කරන්ට පුළුවන. නමුත් ඒ කිසිවක් නොකොට තමාම නගරයට ගොස් තම වියදමින්ම අළුත් වීදුරුවක් ගෙනැවිත් තම අතින්ම එය සාද පෙර තත්ත්වයට ඒ දොර සාද තැබුවේය. දේවකමාව මෙවැනිමය. මෙය සිදු කිරීමටයි මැවුම්කාරතුමා මෙලොවට පැමිණ මනුෂ්‍යයෙකු වී ඒ මනුෂ්‍යත්වයෙන් කුරුසියක් මත ජීවිතය පූජා කළේ. උන්වහන්සේ අපේ අකුසල්වල ඵල විපාකය තමා පිටට රැගෙන එහි ප්‍රතිඵලයක් වශයෙන් මැරුණු සේක. උන්වහන්සේ එසේ මැරී භූමදන කරනු ලැබ, දින තුනකට පසු මරු පරද මරණින් නැගිට මිනී වලෙන් පිටතට පැමිණියහ. මෙයින් අපේ ඵල විපාකය සම්පූර්ණයෙන් උන්වහන්සේ දරා ගෙවා සමාප්ත කළ බව ඔප්පු වේ. කුරුසිය මත උන්වහන්සේගේ ජීවිත පරිත්‍යාගී මරණය සාර්ථක වූ බව ඔප්පු වන්නේ උන්වහන්සේගේ මරණෝත්ථානයෙන්ය. මේ කරුණ පිළිගන්නා වූ සියල්ලන්ටම තම අකුසල් අහෝසි වී එහි ඵල විපාකයෙන් නිදහස ලැබෙන්නේය. තම ජීවිතයේ සැහැල්ලුවක් හා සතුටක් දැනෙයි.

එක දරුවෙකු තම දෙමාපියන්ට හොරෙන් කඩයකින් සීනි බෝල ගැනීමට පටන්ගෙන මාස දෙකකින් රුපියල් 75 ක් කඩයට ණය විය. මුදලාලි එකල තවත් ණයට දෙන්ට බැහැ කියා ණය ගෙවන ලෙස තරයේ ඉල්ලා සිටියේය. ණය විගස නොගෙව්වොත් ඔහු අල්ලා බැඳගන්න බවට තර්ජනය කළේය. එද සිට මේ ළමයා

ඒ මුදලාලි මහ හරිමින් වෙන වට පාරවලින් පාසලට හා වෙනත් ගමන් ගියේය. මේ වග දැනගත් ඔහුගේ පියා මෙසේ යැමට හේතුව සෙවීය. එකල තම දරුවා කඩේ මුදලාලිට ණය වී තිබෙන බැවින් ඔහුට බයේ දුර පාරකින් යන බව දැන ගත්තේය. ඔහු තම දරුවාගේ ණය වහාම ගෙවා දැම්මේය. මට මේ බව දරුවාට කී නමුත් ඔහු එය විශ්වාස නොකළේය. ඒ නිසා ඒ පාරෙන් ගියේම නැත. දුර පාරෙන්ම මුදලාලිට බයේ ගියේය. එකල පියා තම දරුවාට තමා ඒ ණය ගෙවූ බව පැහැදිලි කෙළේය. මෙය දැන් විශ්වාස කළ ළමයා ඉන්පසු නිර්භයව ඒ කඩේ ළඟින්ම නිතර නිතර ගමන් කළේය. මුදලාලිට ද ඒ දරුවාට කිසි තර්ජනයක් කිරීමට ඉඩක් නොවීය.

මැවුම්කාරතුමා පුද්ගලිකව මෙලොවට පැමිණ අප මුද ගැනීමට අපේ ණය ගෙවීමක් වශයෙන් තම නිර්මල ජීවිතය පූජා කළහ. මෙය විශ්වාස කරන අයට නිදහසක් ලැබේ; ණය නැතිවේ; බය ද අතුරුදහන් වේ. එය විශ්වාස නොකළොත් ඒ දේව කමාව හෙවත් ණය ගෙවීමෙන් ඇති වන නිදහස ඇතිවන්නේ නැත. ඒ නිසයි, මේ සත්‍යය හෙවත් ශුභාරංචිය අප විශ්වාස කළ යුත්තේ. ඒ නිසයි අප ඒ බව ඔබට ප්‍රකාශ කරන්නේ.

මැවුම්කාරතුමා ඒ කුරුසිය මත ජීවිතය පූජා කිරීමෙන් කළ මහා ණය ගෙවීමේ පුණ්‍ය ක්‍රියාව කෙළේ අපේ සියලු අකුසල් ගෙවීමටය. අප කර තිබෙන සියලු වැරදි හා නපුරු දෙයෙහි ඵල විපාකයි, උන්වහන්සේ කුරුසිය මත ගෙව්වේ. එම නිසා ඕනෑම කෙනෙකුගේ ඕනෑම බරපතල අකුසලක් හෝ ඕනෑම තරම් අකුසල් අහෝසි කිරීමට ඒ පූජාවම සෑහේ.

හැබැයි අපේ අකුසල් අහෝසි කරගෙන එයින් නිදහස් වීමට අවංක අපේක්ෂාවක් අප තුළ තිබිය යුතුයි. එසේ නැතිව මැවුම්කරුතුමන් බලහත්කාරයෙන් අපේ අකුසල් අහෝසි කරන්නේ නැත. මෙතනයි මනුෂ්‍යයාගේ කොටස නොහොත් වගකීම් තිබෙන්නේ. ඇත්තයි, මනුෂ්‍යයාට තම දුර්වලකම් ඉවත් කර

ගැනීමට අමාරුයි. ඇතැම් දුර්වලකම්වලට ඇබ්බැහි වී තිබේ නම් ඒවා ඉවත්කර ගැනීමට කිසිසේත් නුපුළුවන. ඒවා අත්හැර ගෙන එන්ට කීවොත් එය නොකළ හැකි කාරණයක් වෙනවා ඇත. නමුත් අවශ්‍ය වන්නේ ඒවා අත්හැර දැමීමට නොහොත් එයින් නිදහස් වීමට අපේක්ෂාවයි. එවැනි අවංක අපේක්ෂා ඇති තැන මැවුම්කාරතුමන් ඒ අකුසල් අහෝසි කරති.

මේ අකුසල් අහෝසි කිරීම හෙවත් දේව සමාව නිසා ඔබ මැවුම්කරුතුමන් සමඟ මිත්‍රකමට ඇතුළත් වන අතරම උන් වහන්සේගේ දරුකමටත් ඇතුළත් කරනු ලැබේ. උන්වහන්සේගේ පවුලේ දරුවෙක් වන්නේය. එබැවින් මේ අත්දැකීමට ඇතුළත් වූ සියලු දෙනාම එකම ආත්මික පවුලක සහෝදර සහෝදරියන් වෙති. එබැවින් මේ අය අතර ජාති භේද, කුල භේද කිසිවක් නැත. සමානාත්මතාව යන්නෙහි යථාර්ථය මෙයයි.

## 9. පවිත්‍රව සිටීම

පසුගිය පරිච්ඡේදයෙන් ඔබට පෙනෙනවා ඇති පාප කමාව සුළුපටු දෙයක් නොවන බව. එය අපට කිසි අපහසුවක් නැතුව, වියදමක් නැතුව ලබාගත හැකි නමුත් මැවුම්කාරතුමන්ට එය වියදම් සහිත ගාම්භීර දෙයකි. පාපයේ දරුණු ඵලවිපාකය ගෙවීමට ඒ භයානක, අඳුරු තිත්තකම හා අධික වේදනාව, මනුෂ්‍යත්වය ගත් මැවුම්කරුතුමන්ට විඳින්නට සිදුවිය. එබැවින් එය වටහා ගන්නා තැනැත්තාට එහි අගනාකම අවබෝධ වී ඔහු තුළ විශාල කෘතඥතාවයක් හට ගනී. ඔහුගේ සිත ස්තුතිවන්ත කමින් පිරී යයි. ඔහු ගැඹුරු ලැදියාවකින් හා ණය ගැතිකමකින් මැවුම්කරුතුමන්ට භාර වෙති. මින් මතු එවැනි අකුසල් කිරීමට සිත ප්‍රිය නොකරයි. එයින් මිදී සිටින්නට උනන්දු වෙයි. ඔහුගේ පිරිසිදු වූ සිත අපවිත්‍ර කර ගැනීමට අසතුටු වේ. එය පිවිතුරු තත්ත්වයෙන්ම තබාගැනීමට රුචි වෙයි. තවද තමා තුළ කලින් තිබුණ වැරදි ආශාවන් හා හැසිරීම්වලටද පිළිකුලක් ඇතිවේ.

පාප කමාව හෝ අකුසල් අහෝසි කිරීමේ මේ මහා කාරුණික දයාදය අප තවත් පාප කිරීමට පොළඹවන්නේ නැති බව මෙයින් හොඳට දක්වයි. ඇත්තෙන්ම කමාව ලැබීමේ අත්දැකීම් ඇති කෙනෙක් තුළ තවත් පාප කිරීමට අසතුටක්, පිළිකුලක් හා භයක් ඇති වන්නේය. ඉදිරියට සැහැල්ලු පිරිසිදු සිතක් ඇතිව ජීවත් වීමට ධෛර්යයක් ද ඇති වන්නේය. පාප කමාවක් නැත්නම් කළ පාප බරින් හා කිළුටින් වෙහෙස වී අඳුරු සිතකින් හා කලකිරීමකින් යුතුව අධෛර්යයෙන් ඉදිරියට යන්නේය. යහපත් ජීවිතයකට පා තබන්ට ධෛර්යයක් ඇති වන්නේ නැත.

බොහෝ අය ජීවත්වන්නේ තමන්ගේ පසුගිය අතපසුවීම් හා ප්‍රමාද දෝෂයන් ගැන සිත දෝෂාරෝපණය ඇති වෙමින්; පසුතැවෙමින්; තම ජීවිතය කිලුටු විය, චරිතය දූෂ්‍ය විය, කියා පිරිසිදු ජීවිතයක් ගත කිරීමට උනන්දුවක් නොගෙන අධෛර්යයෙන් ජීවත් වන්නෝය. එසේම සෙසු අයද එවැන්නන් සදහට හංවඩු ගසා ඔවුන් නිග්‍රහකොට සලකති. ඔවුන්ට තවත් අවස්ථාවක් නොදෙති. නමුත් පාප කමාව තිබෙන නිසා ඕනෑම තැනැත්තෙකුට තම යටගියාව ඉවත ලා අළුත් ජීවිතයක් වෙත පා තබන්ට පුළුවන. පාපකමාව විශ්වාස කරන අය අනුන්ට නිග්‍රහ නොකොට ඔවුන් කොපමණ පිරිහී සිටියත් ඔවුන්ට පාප කමාව ලබාගෙන යහපත් ජීවිතයකට පා තබන්ට පුළුවන් බව ද පිළිගනියි. එවැනි පියවරක් ගත් තැනැත්තෙකු දැන් අළුත් තැනැත්තෙකු වශයෙන් සලකනවා මිස ඔහුගේ පරණ ඉතිහාසය අනුව සලකන්නේ නැත. මෙසේ පාප කමාව යන සත්‍යය හා අත්දැකීම් නිසා අපට එකිනෙකා සමඟ හොඳ, පිරිසිදු, මිතුරු ඇසුරක් ගත කිරීමට පුළුවන.

තවද මේ කමා කරන පාප ගැන මැවුම්කරුතුමන් කියා තිබෙන්නේ අපේ පාප උන්වහන්සේ මකා දමා අහෝසි කර නැගෙනහිර බස්නාහිරින් දුරව තිබෙන්නාක් මෙන් ඒවා අපෙන් ඉවත් කරන බවයි. උන්වහන්සේ ඒ සියල්ල අමතක කරන සේක.

පාප කමාව ලැබුණු තැනැත්තෙකු දැන් එම පාපවලට ගිජුකමක් නැත. ඔහු අතින් එම වරද නැවත සිදුවන්නට පුළුවන. නමුත් එය ඔහු දැන් රුචි කරන දෙයක් නොවේ. ඔහු අතින් එය සිදුවන්නේ ඉතා අප්‍රිය ලෙසය, අසතුටිනි. එය සිදු වූ කල ඒ ගැන විශාල අප්‍රසන්න තත්ත්වයක් හා අසහනයක් ඇති වන්නේය. යේසුස් වහන්සේ කෙරෙහි විශ්වාසය රඳවා උන්වහන්සේට තම සිත තුළ වාසය කිරීමට ආරාධනා කළ අවස්ථාවේ ඇතිවුණු සතුට හා ප්‍රීතිය හීන වන්නේය.

ප්‍රීතිය නැවත ලබාගැනීමට ආශාවක් ඇති වන්නේය. එසේ නැත්නම් ඒ හීන වූ ප්‍රීතිය ගැන ඔහු බොහෝ දුකින් පිරී සිටින්නේය. නමුත් මේ තත්ත්වය ගැන අධෛර්‍ය්‍ය වීමට අවශ්‍ය නැත. ඒ ප්‍රීතිය නැවත අළුත් කර ගැනීමට මාර්ගය තවම විවෘත වී තිබේ. මැවුම්කරුතුමන්ගේ මෛත්‍රිය අපේ අකුසලට වඩා අධිකය. එම නිසා උන්වහන්සේ අපට පවිත්‍රවීමේ මාර්ගය නොවසා විවෘතව තබා ඇත.

නැවත පවිත්‍ර වීමට අප කළ යුත්තේ අපේ වරද නොහොත් අකුසල අවංකව ඒත්තු ගැනීමයි. එය වරදක්ම යයි අප පිළිගත යුතුයි. එය ඒ තත්ත්වයෙන්ම උන්වහන්සේට කියා සිටිය යුතුයි. එකල උන්වහන්සේ අපේ අකුසල යේසුස්වහන්සේ කුරුසිය මත පරිත්‍යාග කරමින් වැගිරූ ජීවිතයෙන් සෝදා දමති. කෙලින්ම පාපය යි හැඳින්වෙන දේ පමණක් නොව ඕනෑම අනුමාන සහිත ක්‍රියාවක්, වචනයක් හා චේතනාවක්ම මෙසේ අපි මැවුම්කාරතුමාට කියා සිටිය යුතුය. ඒ වරද හෝ අකුසල සමාජයට හෝ මිනිසෙකුට විරුද්ධව කළ දෙයක් විය හැකි නමුත් එය මැවුම්කරුතුමන්ටම විරුද්ධව කරන ලද අපහාසයක් හා අකීකරුකමක් බව අප ඒත්තු ගත යුතුයි. අප මෙවැනි ස්වරයකින් කියා සිටිය යුතුයි, "මම ඔබවහන්සේට විරුද්ධව පව් කළෙමි. ඔබටම විරුද්ධව පව් කෙළෙමි. මට කරුණා කළ මැනව, ඔබේ අධික දයාව පරිද්දෙන් මගේ පාප අහෝසි කළ මැනව".

නමුත් මේ නිතර අතපසුවීමේ ප්‍රශ්නය මෙසේ පවිත්‍ර වීමේ මාර්ගයෙන් ඒ වේලාවට පමණක් විසඳ ගැනීම ප්‍රමාණවත් නැත. මෙයට මීට වඩා ගැඹුරෙන් ක්‍රියා කළ යුතුයි. මීට වඩා පවතින ප්‍රතිකාරයක් අවශ්‍යයි. අපේ ප්‍රධාන දුර්වලකම්වලින් පමණක් නිදහස්වීම මදිය. නිතර අප අතින් සිදුවන සුළු දුර්වලකම්වලින් ද නිදහස් විය යුතුය. අපේ කැපවීම අවංක නම්, අපේ ඇල්ම සැබෑ නම් මැවුම්කරුතුමන් සතුටු වන පිරිසිදු ජීවිතයක් අප නිතර ගත කළ යුතුයි.

නමුත් අපේ පිරිහුනු මනුෂ්‍යත්වය නිසා අප තුළ තිබෙන මනුෂ්‍ය ස්වභාවය ආත්මාර්ථකාමී ස්වභාවයකි. මේ ආත්මාර්ථකාමී ස්වභාවය පාපයට, ලෝකයට හා යක්ෂයාට ඇල්මක්ද කීකරු වීමක්ද ඇතුව සිටියි. එබැවින් මින් මතු පාපයට ඇලුම් නොවන පිණිස මේ ආත්මාර්ථකාමී ස්වභාවය බෙලහීන කළ යුතුයි. එය බෙලහීන වන්නේ අපේ පරණ මනුෂ්‍යයා යේසුස්වහන්සේගේ කුරුසියේ ඇණ ගැසූ කල ය. පරණ මනුෂ්‍යයා යනුවෙන් හැඳින්-වෙන්නේ යේසුස් වහන්සේ කෙරෙහි අදහා ගෙන, උන්වහන්සේගේ කුරුසිය මත තම මමත්වය ඇණ ගසනු ලැබ නැසීමට භාරදෙන දිනය දක්වා තිබෙන ඒ ජීවිතයටයි. හොඳ හෝ නරක හෝ වුවත් එය පරණ මනුෂ්‍යයාය.

පරණ මනුෂ්‍යයා කුරුසියේ ඇණ ගසා වලලා දැමිය යුතුයි. එය කරන තුරු අපේ ආත්මාර්ථකාමී ස්වභාවය බලගතුය. එමනිසා අකුසල දෙසට නැමෙයි. පාපයටම රුචි කරයි.

පරණ මනුෂ්‍යයා ඇණ ගසනු ලැබීමෙන් ජීවිතයේ සම්පූර්ණ පරිවර්තනයක් ඇති වන්නේය. අළුත් ජීවිතයක් ආරම්භ වන්නේය. සෑම මනුෂ්‍යයෙක්ම බලාපොරොත්තු රැසක් ඇතිව ජීවත් වෙයි. මෙය මමත්වයේ ගමනකි. තම කැමැත්තේ, හිතු මනාපේ ජීවත් වීමයි. මේ ගමන වෙනස් කරමින් සම්පූර්ණයෙන් විරුද්ධ පැත්තට හැරී මැවුම්කරුතුමන් දෙස මුහුණපාමින් සිටින්නට ඕනැය. එසේම තමාගේ ඇති දැඩිවීම්, අධ්‍යාපන හා

උත්සාහය නිසා ගොඩනගාගත් චරිතය හා දක්ෂකම් කෙරෙහි විශ්වාසය රැඳිය නොයුතුයි. තවද තම අදහස් උදහස් හා මුලු ආකල්පය සහමුලින්ම වෙනස් කර ගැනීමට සතුටු විය යුතුයි. තම සිතුවිලි ලෝකය ඉවත ලා මැවුම්කාරතුමා කියා සිටින දේ පිළිගත යුතුයි. අපේ පරණ මනුෂ්‍යයා කුරුසිපත් කිරීමේදී අපේ පරණ ජීවිතයේ මේ සියලු දේවල් ඉවතලන්ට සිදුවේ. මෙය කිරීමට අසතුටු නම් එයින් පෙනෙන්නේ පරණ මනුෂ්‍යයා ඇණ ගසනු ලැබීමට දීමට අසතුටු බවයි. නමුත් මේ පියවර ගැනීමෙන් විශාල නිවහල් භාවයක්ද විමුක්ති සහනයක්ද අත් වන්නේය. මේ පියවර ගත් කල යේසුස් ක්‍රිස්තුන් වහන්සේට පුදුම අන්දමින් අපි සම්බන්ධ වී උන්වහන්සේගේ මරණයට ද එකාබද්ධ වී උන්වහන්සේ සමඟ ඒ කුරුසියේ තමාද ගුප්තාර්ථයෙන් මැරෙයි. පරණ මනුෂ්‍යයා මැරෙයි. උන්වහන්සේ සමඟ සොහොන්පත්වී උන්වහන්සේගේ මරණෝත්ථානයටද හවුල් වී අපිද අළුත් ජීවිතයකට අළුතින් උත්ථානය වන්නෙමු. මේ අළුත් ජීවිතය යේසුස්වහන්සේට සම්බන්ධ වූ, හවුල් වූ ජීවිතයකි. මෙය ඇත්තෙන් අළුතින් මවන ලද ජීවිතයකි. මේ ජීවිතය තුළ සියලු පරණ දේ පහව ගොස් සියලු දේම අලුත් වෙනවා ඇත. මේ තත්ත්වයට පරිවර්තනය වීමට කැමැති නම්, මේ පියවර ගන්ට කැමති නම්, කරන්ට තිබෙන්නේ ඔබේම සිය කැමැත්තෙන් අවංකව යේසුස් වහන්සේට ඔබේ ජීවිතය භාර දී මෙසේ කියන්ටයි.

"ස්වාමි වූ යේසුස් වහන්ස, මට මෙතරම් මෛත්‍රිය කර මගේ අකුසල්වල ඵල විපාකය අහෝසි කිරීමට ඔබගේ ජීවිතය කුරුසියක් මත පූජා කළ නිසා ඔබට සදහට ණයගැති වෙමි. මෙන්න ස්වාමීනි මගේ මුළු ජීවිතය ම ඔබේ පාමුල තබමි. මගේ පරණ ජීවිතය සහමුලින්ම ඔබගේ කුරුසිය මත නසා දැමීමට මම මගේ ජීවිතය ඔබට බාර දෙමි. මින් මතු මම මටම අයිති නැත. මම මගේ නොවේ, ඔබ තුමාගේය, ඔබතුමාටම අයිති වෙමි. මෙන්න ස්වාමීනි මගේ වැරදි සියල්ල අහෝසි කොට ඔබවහන්සේට

මගේ ජීවිතය පාලනය කිරීමට මම භාර කරමි. මා තුළට වැඩම කර මා තුළ වාසය කරන්න."

දැන් අපේ පරණ මනුෂ්‍යයා කුරුසියේ ඇණ ගැසූ නිසා අපේ ආත්මාර්ථකාමී ස්වභාවය දුර්වල වී තිබේ. එය දැන් අකුසලට හා පාපී ආකර්ෂණවලට වහල් වී නැත. දැන් එය අප තුළ වාසය කරන යේසුස්වහන්සේගේ පාලනයට යටත්ව ඉදිරියට යයි.

මින් මතු ඔබ පාප විමුක්ති ලත් අයෙක් බවද යේසුස් වහන්සේ තුළ මැවුම්කරුතුමන් උදෙසා ජීවත්ව සිටින්නෙක් බවද සිතට ගන්න. එබැවින් මරණින් උත්ථානය වූ තැනැත්තෙකු මෙන් ඔබේ ඉන්ද්‍රියයන් දමිටු බවෙහි ආයුධ ලෙස උන්වහන්සේට භාර කරන්න.

මේ ගත් පියවර හා ලැබූ අත්දැකීම් දිනපතා සිහිපත් කරන්න. ආවර්ජනය කරන්න. "දැන් මම ජීවත් වෙමි. එහෙත් මා නොව මා තුළ සිටින යේසුස්වහන්සේය" කියා කියන්න. දැන් ජීවත්වන මම මා උදෙසා ජීවත් නොවී මා උදෙසා මැරී මරණින් නැගිට්ට යේසුස්වහන්සේ උදෙසා ජීවත්වෙමි කියා පරහට සේවය කරන්න. පරාර්ථකාමීව ජීවත් වන්න. මක්නිසාද ඔබ තුළ දැන් යහපත් දේ අදහස් කිරීමටත්, එය ක්‍රියා කිරීමටත් ක්‍රියා කරන්නේ යේසුස් වහන්සේය. ඔබ ශක්තිමත් කරන ක්‍රිස්තුස් වහන්සේගේ ශක්තියෙන් ඔබට සියලු දේම ඉෂ්ට කළ හැක.

ඔබ දිනෙන් දින ක්‍රිස්තුස් වහන්සේගේ ස්වභාවයෙන් උන්වහන්සේ වැනිම තැනැත්තකු වනතුරු වැඩෙන්නේය. සකල ලෝකයේ සාමයේ හා මහිමයේ බලාපොරොත්තුව යනු ක්‍රිස්තුස් වහන්සේ ඔබ තුළ වාසය කිරීමයි. ඔබ තුළ එතුමන් නැත්නම් ඔබේ ප්‍රයත්නය හා අධිෂ්ඨානය නිශ්ඵලයි. මේ ඉහත සත්‍යයන් වඩා තහවුරු වන්නේ යේසුස් වහන්සේ හා සමඟ ආශ්‍රයේ පිහිටා සිටීමෙනි. එබැවින් දිනපතා යාච්ඤා කිරීම, බයිබලය කියවීම, ඉතා වැදගත්ය. යාච්ඤාවේ දී ඔබ උන්වහන්සේට කථා කරන

අතර බයිබලය කියවීමේදී එය තුළින් උන්වහන්සේ ඔබට කථා කරති. තවද බයිබලය නිතර කියවා එය අනාවරණය කරන දේ සිහියේ අළුත් කර තබාගැනීමත්, අනුමත කිරීමත් එහි නියම වන දේට කීකරු වීමත්, මේ අළුත් ජීවිතයේ පිහිටා සිටීමට ඉතා වැදගත්ය. ඒ නියමයන්ගෙන් ඉතාමත් උතුම් එකක් වන්නේ යේසුතුමන්ගෙන් ඔබට ලැබුණු සහනය අනුන්ට කියා දීමය. තවද මෙසේ දිනපතා යාච්ඤා කිරීමෙන් හා බයිබලය කියවීමෙන් ඔබට ජීවිතයේ උග්‍ර අවස්ථාවක දී හෝ විශේෂ කරදරයකදී හෝ මැවුම්කරුතුමන්ට එය කියා සිට එයට විසඳුමක් ලබාගත හැක. මන්ද රෑ දවල් යාච්ඤා කරන අයගේ කන්නලව්ව අසා විසඳුමක් දීමට උන්වහන්සේ පොරොන්දු වී තිබේ.

## 10. මරණය

මරණය අවසානයක් නොවේ. ජීවිතයේ දොරකඩක් පමණකි. මනුෂ්‍යයා තුළ ජීවමාන පුද්ගලභාවයක් තිබෙන නිසා ඔහු ශාරීරික වශයෙන් මැරුනු කල ඔහුගේ ඉතිහාසය එතැනින් නිමවන්නේ නැත. එය එසේම නිම වන්නේ නම් අපේ ජීවිතයේ කිසි අර්ථයක් නැත. යහපත් සිල්වත් ජීවිතයක් ගත කිරීමෙන් පලක් නැත. පරලොව ජීවිතයක් තිබේ. ඉතින් මරණය ඒ ජීවිතයට දොරටුවක් පමණි. යේසුස් වහන්සේ අනේක වාරයක් මරණය නිදගැනීමකට සමාන කර තිබේ. මරණය නිදගැනීමක් වැනිය. පරලොව යෑම නින්දෙන් පිබිදීම වැනියි. බොහෝ විට නිවසේදී වැඩිහිටි අය කථා-බස් කරන අතර ඔබේ ඉස්තෝප්පුවේදී කුඩා දරුවෙක් නිදගනී. ඉන් ඉක්බිති ඔහු නිදන කාමරයට ගෙන යනු ලැබේ. ඔහු දිගටම සුවසේ නිදගෙන උදේ පාන්දර අවදිවන්නේය. ඔහුට නින්ද ගියේ ඉස්තෝප්පුවේදීය. නමුත් ඔහු අවදි වූයේ ගෙයි ඇතුලේදීය. අපි මේ ලෝකයේදී මැරී පරලොවදී පිබිදෙන්නෙමු. මව දරුවා ඔසවාගෙන යන ලෙසම යේසුස්වහන්සේද අප ඔසවා

ගෙන යැමට අප ඉදිරියට පැමිණ සිටින බව ප්‍රකාශ කරමින් ඉතා ප්‍රීතියෙන් මැරෙන අය එමටය. ළඟ සිටින සියලු ඥාතීන්ට විස්මයකි, සැනසීමකි, ආදර්ශයකි.

තවද මරණය දුර බැහැර ගමනකට සමාන කළ හැකිය. ඒ ගමන මීට පෙර ගොසින් නැති නිසා යැම බියසුලු දෙයක් වන්නට පුළුවන. අතරමං වීමට ද පුළුවන් නමුත් ඒ ගමන ගොස් නැවත පැමිණි කෙනෙක් සිටින්නේ නම් ඔහු කැටුව යනවා නම් නිර්භයව අපට ඒ ගමනට පා තැබිය හැකිය. ඇත්තෙන්ම එවැනි කෙනෙක් සිටිති. එනම් යේසුස්වහන්සේය. උන්වහන්සේ වරක් ඒ ගමන ගොස් නැවත මෙහි පැමිණියහ. උන්වහන්සේ මැරී මරණින් එතෙරට ගොස් නැවත මෙතෙරට පැමිණියහ. දැන් උන්වහන්සේ සදහටම ජීවත් වී සිටිති. උන්වහන්සේ අප ස්වර්ගයට ගෙන යැමට පොරොන්දු වූහ. උන්වහන්සේ අප ඉදිරියට එන නිසා අප සැම කෙනෙකුටම උන්වහන්සේ දැක ගැනීමට ලැබේ. එකල උන්වහන්සේට ඇලුම් ඇති අය උන්වහන්සේ වෙත දුවති. එසේ නැති අය උන්වහන්සේ ප්‍රතික්ෂේප කරමින් උන්වහන්සේ වෙතින් පලා යති. උන්වහන්සේ වෙතට සතුටු වී යන අය උන්වහන්සේ වාසය කරන ස්ථානයට එනම් ස්වර්ගයට හෙවත් මෝක්ෂයට උන්වහන්සේ ගෙන යයි. එහි සම්පූර්ණ සැපත සුවය ඇත. එහි දුක, වේදනා, ජරා, මරණය යනාදී කිසිවක් නැත.

ඔබ කිසි දිනක අප්‍රිකාවට නොගිය තැනැත්තෙකු නම් එහි යන්ට සිදුවූ කල ඔබ බිය වනු ඇත. නමුත් අප්‍රිකාවේ පදිංචි වී සිටි කෙනෙක් ඔබ ලංකාවෙන් පිටත් වන තැන වූ කටුනායක ගුවන් තොටුපොළට පැමිණ ඔබ කැටුව යන්නේ නම් ඒ යන ස්ථානය ඔබ නොදන්නා සථානයක් වුවද ඔබ එහි සම්පූර්ණ අමුත්තෙක් වන්නේ නමුත් කිසි භයක් සැකක් නැතුව ඔබ එහි යනු ඇත. මරණයේදී ඔබට මුහුණ පාන්නට තිබෙන්නේ එවැනි තත්ත්වයකි. මරණයෙන් පසු ජීවිතය ගැන ඔබ කිසිත් දන්නේ නැත. එබැවින් පරලොව ගැන ඔබේ තිබෙන බිය සැක පුදුමයක්

නොවේ. නමුත් ඔබ මරණින් ඔබ්බට යන කල ඔබ කැඳවාගෙන යෑමට පරලොව සිට එනම් ස්වර්ගයේ සිට මෙහි වරක් පැමිණ අපට මෛත්‍රිය දැක්වූ යේසුස්වහන්සේ මුණ ගැසෙනු ඇත. උන්වහන්සේ මෙහි පැමිණ ගොස් අපට ස්ථානයක් පිළියෙල කරන බව ද අප එහි ගෙන යෑමට අප මුණ ගැසෙන බවට ද පොරොන්දු වූහ. එබැවින් එතුමන් දැන්ම හඳුනාගැනීම නුවණට හුරුය. මේ පොත් පිංචෙහි පරමාර්ථය එයයි. එනම් ඔබ උන්වහන්සේ හඳුනාගෙන උන්වහන්සේගේ ඇසුරෙහි ජීවත් වී වාසනාවන්ත අනාගතයක් රක්ෂණය කර ගැනීමයි. ඒ වාසනාවන්ත අනාගතය නොහොත් මෝක්ෂ සම්පත්තිය දැන්ම රසවිඳිය හැකිය. එසේ එය දැන්ම රස බලා එය අනර්ඝතම බැවින් එය අහිමි නොවන ආකාරයෙන් ද, එය ලබා ගැනීමට මේ ලෞකික ජීවිතයද ගත කරන අතර පාපයට අසු නොවී වහල් නොවී හොඳ හෘදය සාක්ෂියක් පිවිතුරු චරිතයක්ද ඇතුව ජීවත්වීමට එතුමන්ගේ අතට භාරවෙන්න. එකල මේ ජීවිත කාලයම ඔබට වාසනාවන්ත ප්‍රීතිමත් කාලයක් වෙනු ඇත. තවද ඔබේ ජීවිතය අළුත් අරමුණක් කරා එනම් ස්වර්ග මෝක්ෂය කරා යොමුවන නිසා ඔබේ ජීවිතයද අර්ථවත් හා තෘප්තිමත් එකක් වෙනවා ඇත. යේසුස් වහන්සේ සමඟ දැන් අධ්‍යාත්මික ලෙස ආශ්‍රයක් පටන් ගෙන, එහි වැඩි වර්ධනය වී මේ ජීවිතයේ අවසානයේදී උන්වහන්සේ මුහුණට මුහුණ ලා දැන හඳුනාගෙන ඊටත් වඩා අනර්ඝ ඇසුරක් ඔබට අත්පත් වන්නේය.